# සංදේශයක් ග්‍රාහකගත කිරීමේ දී උපයුක්ත සන්නිවේදන ශිල්පක්‍රම පිළිබඳ බෞද්ධ දාර්ශනික පර්යාලෝකය

සමන් රාජපක්ෂ[1], අමාලි උත්පලා නන්දසිරි[2], එච්.ඩබ්ලිව්. කුසලා සජීවනී[3]

## හැඳින්වීම

වර්තමානයේ තොරතුරු ලබා දීම සඳහා බොහෝ මාධ්‍ය අන්තර්ගතයන් හා මාධ්‍ය නාලිකා බිහි වී තිබේ. නමුත් තොරතුරු ග්‍රාහකගත කිරීමේ දී සමාජයේ පවතින අධි තොරතුරු ගලනය හේතුවෙන් ග්‍රාහකයාගේ තොරතුරු සංවේදීත්වය වේගයෙන් ගිලිහී යමින් පවතියි. (Simon, 1971; Eppler and Mengis, 2004; Bawden and Robinson, 2009; Carr, 2010)' තොරතුරු සංවේදීත්වය ග්‍රාහකයා කෙරෙන් ගිලිහී යාම තොරතුරු ලබා දීමෙන් අපේක්ෂිත සන්නිවේදනයේ ඵලදායී බව බැහැරවීම කෙරෙහි හේතු වේ. මෙමගින් සන්නිවේදනයෙන් අපේක්ෂිත අරමුණු වශයෙන් ගැනෙන දැනුවත්භාවය, පෙලඹවීම, අධ්‍යාපනය, සමාජ සුරක්ෂිතභව, විනෝදාස්වාදය යනාදී කාර්යයන් ඉටුනොවේ. එසේ ම සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් තොරතුරු සන්නිවේදන කාර්යයේ දී මහජනතාව බලගැන්වීමට අවශ්‍ය මූලික සාධක අතර තොරතුරු සන්නිවේදනයට ප්‍රධාන තැනක් හිමි වේ. නමුත් නූතන තොරතුරු සන්නිවේදනයේ දී භාවිත 'සන්නිවේදන ශිල්පක්‍රම' සම්බන්ධයෙන් පවතින අඩු අවධානය හේතුවෙන් සමාජය තුළ තොරතුරු පිළිබඳ ග්‍රාහක අවධානය, ආකර්ෂණය, අපේක්ෂිත ඵල ළඟා කර ගැනීමට නොහැකි වේ.

තොරතුරු ඉදිරිපත් කිරීමේ දී තොරතුරුවල ස්වභාවය, මාධ්‍යයේ ස්වභාවය මෙන් ම ග්‍රාහකත්වය හා ඉන් සිදු කෙරෙන සමාජ බලපෑම පිළිබඳ නූතනයේ විවිධ අයුරින් අවධානයට යොමු වී ඇත. එහි දී මාධ්‍ය සංදේශවල අන්තර්ගතයේ ගුණාත්මකබව, මාධ්‍යයේ උපයෝගිතාව, ස්ත්‍රී පුරුෂභාවය හා සමාජ තත්ත්වය අනුව ග්‍රාහක චර්යා කෙරෙහි ඇති කරන සමාජ බලපෑම පිළිබඳ සාකච්ඡා කෙරේ. එසේ ම, රටක පවතින ආපදාමය අවස්ථාවල දී, අර්බුදකාරී අවස්ථාවල දී, අපරාධමය තොරතුරු වාර්තා කිරීමේ දී, ළමයින් හා කාන්තාවන් පිළිබඳ වාර්තා කිරීමේ දී වාර්තාකරණයේ සමාජ අවශ්‍යතාව අනුව 'සන්නිවේදන ශිල්පක්‍රම' භාවිතයට ගැනීම පිළිබඳ විමර්ශනය කිරීම කාලීන අවශ්‍යතාවකි.

එබැවින් නූතන සන්නිවේදනයේ දී සංදේශයක් ග්‍රාහකගත කිරීමේ ක්‍රියාවලිය සමාජ, මනෝවිද්‍යාත්මක සහ දාර්ශනික පදනමක් සහිතව පෝෂණය කළ යුතු බව පෙනේ. එබැවින් මෙම අධ්‍යයනයේ ගැටලුව වන්නේ සංදේශයක් ග්‍රාහක ගත කිරීමේ දී උපයුක්ත සන්නිවේදන ශිල්ප ක්‍රම පිළිබඳ බෞද්ධ දාර්ශනික පර්යාලෝකය කෙබඳුද? යන්නයි.

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. saman.rajapaksha@kln.ac.lk

2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. amali.nandasiri@kln.ac.lk

3 සහකාර පුස්තකාලයාධිපති, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. kusala@gwu.ac.lk

**අරමුණු**

1. සංදේශයක් ග්‍රාහකගත කිරීමේ දී උපයුක්ත සන්නිවේදන ශිල්පක්‍රම පිළිබඳ බෞද්ධ දාර්ශනික පර්යාලෝකය පිළිබඳ අධ්‍යයනය කිරීම
2. සංදේශයක් ග්‍රාහකගත කිරීම සම්බන්ධයෙන් බුදුදහමේ ඉගැන්වෙන සන්නිවේදන ශිල්පක්‍රම තුළ පවතින සමාජ මනෝවිද්‍යාමක ලක්ෂණ විමර්ශනය කිරීම
3. නූතන මාධ්‍ය සංදේශ ග්‍රාහකගත කිරීමේ දී බුදුදහමේ විවරණය කෙරෙන සන්නිවේදන ශිල්පක්‍රම භාවිතය ගත හැකි ආකාරය අධ්‍යයනය කිරීම

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙහි දී නිගාමී පර්යේෂණ ප්‍රවේශය යටතේ අන්තර්ගත විශ්ලේෂණය පර්යේෂණ උපාය මාර්ගය ලෙස භාවිතය ගැනිණි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමය අනුව ද්විතීයික දත්ත රැස් කරන ලදී. දීඝනිකාය, මජ්ඣිමනිකාය, සංයුත්තනිකාය, අංගුත්තරනිකාය, ඛුද්දකනිකාය ආදියෙහි අන්තර්ගත සූත්‍ර දේශනා අතරින් තෝරාගත් සූත්‍ර දේශනා මූලාශ්‍රය වශයෙන් ගෙන ඒවායේ අන්තර්ගතය විමර්ශනය කිරීමෙන් ලබා ගන්නා දත්ත තුලනාත්මක ව ස්වයං විශ්ලේෂණයට ලක් කෙරුණි.

**දත්ත විශ්ලේෂණය**

**බුද්ධ දේශනාවේ සන්නිවේදන පිළිවෙත**

බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කිරීමේ දී නොයෙක් සන්නිවේදන ශිල්පක්‍රම භාවිත කළහ. උන්වහන්සේ ධර්ම දේශනා, සාකච්ඡා, සංවාද වෙතින් තමන් වහන්සේ අපේක්ෂා කරනු ලබන දේ මෙන් ම දේශනාවේ අන්තර්ගතය ශ්‍රාවකයාට මැනවින් ගෝචර වන පරිදි විග්‍රහ කිරීම පිණිස විවිධ සන්නිවේදන ශිල්පක්‍රම අනුගමනය කළ බව පෙනේ. ඕනෑ ම සංදේශයක් ග්‍රාහකයාගේ රුචිකත්වයට සහ අවශ්‍යතාවට අනුරූප ලෙස පැහැදිලි කිරීම, විමර්ශනය කිරීම සහ විශ්ලේෂණය කිරීම සන්නිවේදකයා සතු වගකීමකි. සංදේශයෙහි අන්තර්ගත කරුණු ග්‍රාහකයාට ඉදිරිපත් කිරීමේ දී උපයෝගී කර ගත් සන්නිවේදන ශිල්පක්‍රම කිහිපයක් බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් ඇසුරින් හඳුනා ගත හැකි ය.

i. විත්ථාරදෙසනා

ii. සංඛිත්තදෙසනා

iii. සම්මුතිදෙසනා

iv. පරමත්ථදෙසනා

v. නෙයාත්ථදෙසනා

vi. නීතත්ථදෙසනා

vii. පරියායදෙසනා

ධර්ම දේශනයක දී දේශකයා විසින් ග්‍රාහකයාට කරුණු විස්තර සහිතව ඉදිරිපත් කිරීම විත්ථාර දේශනා ක්‍රමයට අයත් වේ. මෙහි දී විවිධ දෘෂ්ටිකෝණ මත පිහිටමින් විස්තරාත්මක ව කරුණු ඉදිරිපත් කෙරේ. බුදුරජාණන් වහන්සේ සූත්‍ර දේශනාවන්හි බොහෝ කරුණු විත්ථාර දේශනා ක්‍රමය යටතේ විශ්ලේෂණාත්මක ව ඉදිරිපත් කළහ. මෙමගින් ඕනෑ ම සරල, සාමාන්‍ය සිදුවීමක් වුව ද විස්තරාත්මක ව ශ්‍රාවකයාට ඉදිරිපත් කිරීමට පිළිවන. ඇතැම් විට සංදේශයක් සංක්ෂිප්ත ව විවරණය කිරීම ග්‍රාහක අනවබෝධය පිණිස හේතු වේ. එහි දී වටහා ගැනීමේ දුර්වලතා මෙන් ම අර්ථකථනයේ දුර්වලතා පැන නැගිය හැකි ය. ඒ අනුව සංක්ෂිප්ත ව ඉදිරිපත් වන කරුණු වටහා ගැනීමට අපොහොසත් ග්‍රාහකයන් උදෙසා විත්ථාර දේශනා ක්‍රමය යොදාගත හැකි ය.

බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනාවන්හි දී විස්තරාත්මක ව කරුණු දක්වන්නා සේ ම සංක්ෂිප්ත වශයෙන් ද කරුණු ඉදිරිපත් කරති. මෙලෙස විස්තර විභාගයකින් තොර ව සැකෙවින් පවත්වන දේශනා සංඛිත්ත දේශනා ලෙස හැඳින්වේ. මෙම දේශනාවන්හි දී කරුණු එක් පිඬකට කැටි කොට ඉදිරිපත් කෙරේ. බොහෝ විට සංඛිත්ත ධර්ම දේශනාවන්ට විෂය වන්නේ බුද්ධිය සහ දැනුම මුහුකුරා ගිය ග්‍රාහකයන් සඳහා ය. සත්‍ය ගවේෂණය පිණිස ශ්‍රාවක සමූහයා මෙහෙය වීමේ දී විස්තර කථන රහිත ව ඍජු ව ම ධර්ම කරුණු පමණක් ඉදිරිපත් කිරීමට සිදු වේ. අංගුත්තරනිකාය, සංයුත්තනිකාය හා ඛුද්දකනිකාය ආදියෙහි බොහෝ සූත්‍ර සංඛිත්ත දේශනා සඳහා නිදසුන් සපයයි. දේශනාවෙහි කරුණු සංක්ෂිප්ත අයුරින් ඉදිරිපත් වූවාට එහි අරමුණෙහි වෙනසක් සිදු නොවේ.

ව්‍යවහාර ලෝකයට අදාළ කරුණු ඇතුළත් ව සිදු කෙරෙන දේශනා සම්මුති දේශනා වශයෙන් හැඳින්වේ. මෙහි දී පවත්නා ලෝක සම්මතයෙහි විෂය පථයන් සාකච්ඡා කෙරේ. ලෞකික ජීවිතයෙහි විවිධ අරමුණු ඉටු කර ගැනීම කේන්ද්‍ර කොට ගෙන සම්මුති දේශනා පැවැත්වෙන බව හඳුනා ගත හැකි ය. ඒ අනුව ගෘහ ජීවිතයෙහි කටයුතු, ආර්ථික කළමනාකරණය, සමාජ අන්තර් සබඳතා යහපත් අයුරින් පවත්වා ගෙන යනු ලබන ආකාරය, ධාර්මික සමාජ ජීවිතයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය මූලිකාංග, සොබා දහම හා පරිසරය සමග සමීප සබඳතා ගොඩනගා ගන්නා ආකාරය යනාදී ක්ෂේත්‍ර මූලික කොට ගෙන අන්තර්ගතය සකස් වූ දේශනා සම්මුති දේශනා සඳහා නිදසුන් වශයෙන් දැක්වීමට පිළිවන.

බුදුරජාණන් වහන්සේ පරමාර්ථ ස්වභාවය විවරණය පිණිස සිදුකළ දේශනා පරමත්ථ දේශනා යනුවෙන් හැඳින්වේ. පවත්නා ලෝක සම්මතයට එහා ගිය පාරලෞකික තත්ත්වයන්ට අදාළ ඉගැන්වීම් මෙම දේශනාවන්හි විග්‍රහ වේ. බෞද්ධ ශ්‍රාවකයාගේ ඒකායන පරමාර්ථය වන්නේ නිර්වාණය සාක්ෂාත් කරගැනීම යි. ඒ අනුව පුද්ගලයා නිර්වාණය කරා යොමු කරවීම සහ එහි ප්‍රතිපදාවන් පිළිබඳ දැනුවත් කිරීමට පරමත්ථ දේශනා උපයෝගී කර ගනු ලැබේ.

බුද්ධ දේශනා අතර ඇතැම් සුවිශේෂ දේශනා පවතී. එම දේශනා සඳහා ග්‍රාහකයා විසින් අලුතින් අර්ථ එකතු කොට අවබෝධ කර ගත යුතු ය. ඒවා නෙයාත්ථ දේශනා වශයෙන් හැඳින්වේ. මෙහි දී සූත්‍ර දේශනාවෙහි ප්‍රකාශිත අර්ථය ඍජු ව ම වටහා ගැනීමට නොහැකි වන අතර ග්‍රාහකයා විසින් සිදු කරන අර්ථ ගැන්වීම මත පමණක් සූත්‍ර දේශනාවෙන් පැනෙන කරුණු වටහා ගැනීමට හැකි වේ. ඇතැම් අවස්ථාවන්හි දී බුද්ධ දේශනාවෙහි අන්තර්ගත වචන, යෙදුම්, පද තනිව ගෙන තේරුම් ගත නොහැකි ය. එම නිසා වචනයට පමණක් සීමා වී අර්ථ වටහා නොගත යුතු ය. නම්, කුල, ගෝත්‍ර පිළිබඳ දැක්වෙන වචන වටහා ගැනීමේ දී ඒවා යථාර්ථය වශයෙන් නොගෙන ග්‍රාහකයා විසින් අර්ථ ගැන්වීම සිදුකළ යුතු ය. අර්ථකථනය නිසි පරිදි සිදු නොවුන විට දේශනයෙන් ඉදිරිපත් වූ කරුණු විකෘති වී වැටහීමට පිළිවන.

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ ඇතැම් සූත්‍ර දේශනා අර්ථ ගැන්වීමකින් තොර ව ඒ ආකාරයෙන් ම අවබෝධ කර ගැනීමට සිදු වේ. ඒ අනුව ග්‍රාහකයා අලුතින් අර්ථ නොගැන්විය යුතු දේශනා නීතත්ථ දේශනා වශයෙන් සැලකේ. නිදසුනක් වශයෙන් අනිච්ච, දුක්ඛ, අනත්ත මෙන් ම පටිච්චසමුප්පාදය වැනි සංකල්ප අර්ථ ගැන්වීමට යාම මගින් විකෘති අදහසක් උත්පාදනය වීමට පිළිවන. එහෙයින් ඒවා අරුත් නොගන්වා පවත්නා ස්වභාවයෙන් ම වටහා ගත යුතු ය. නිදසුනක් වශයෙන් "අනිත්‍ය වස්තූන් සඳහා සමාන්තර වූ නිත්‍ය වස්තූන් ද පවතී" යනුවෙන් අර්ථ ගන්වා බුද්ධ දේශනාව වටහා නොගත යුතු ය.

එක ම ධර්ම කරුණ විවිධ ප්‍රවේශයන් මත හිඳිමින් නොයෙක් ක්‍රමවේද යටතේ පැහැදිලි කර දැක්වීම බුදුරජාණන් වහන්සේගේ දේශනාවන්හි සුවිශේෂ ලක්ෂණයකි. මෙලෙස ධර්ම කරුණු විවිධ ක්‍රමවේද, විවිධ පිළිවෙත් යටතේ විවරණය කොට දැක්වීම පරියාය දේශනා වශයෙන් හඳුන්වයි. බුදුරජාණන් වහන්සේගේ විග්‍රහයට අනුව උන්වහන්සේ දේශනා කළ ධර්මය පරියාය වශයෙන් දේශනා කොට ඇත. පරියාය දේශනා යන්නෙහි අර්ථය වන්නේ විවිධ ක්‍රමවේද උපයෝගී කොට ගෙන ධර්ම කරුණු පැහැදිලි කිරීමයි. බුදුරජාණන් වහන්සේ විවිධාකාර බුද්ධි මට්ටම්හි පසුවන ග්‍රාහකයන්ට සාර්ථක අයුරින් ධර්මය සන්නිවේදනය කිරීම පිණිස පරියාය දේශනා ක්‍රමය භාවිතයට ගෙන ඇති අයුරු සූත්‍ර ඇසුරින් විනිශ්චය කළ හැකි ය. මේ පිළිබඳ විවරණයක නියැලෙන බුදුරාජාණන් වහන්සේ මජ්ඣිමනිකායේ බහුවේදනීය සූත්‍රය මගින් අනාවරණය කරන්නේ තමන් වහන්සේ පරියාය වශයෙන් වේදනා යන්න දෙකක්, තුනක්, පහක්, හයක්, දහඅටක්, තිස්හයක් ලෙස දේශනා කර ඇති බවයි (මජ්ඣිමනිකාය II, 2006). මෙසේ නිශ්චිත නොවන කරුණු පදනම් කර ගෙන ඉදිරිපත් වන දේශනා විවිධ ක්‍රමවේද ඔස්සේ වටහා ගැනීම වරදක් නොවන බව බුද්ධ දේශනාවයි.

ධර්ම දේශනයේ දී ප්‍රථමයෙන් සතුටු සාමීචි කථාවෙහි නියැලෙන බුදුරජාණන් වහන්සේ අනතුරුව ග්‍රාහකයාට දානාදී පුණ්‍ය කර්මයන්හි නියැළීමේ වටිනාකම පෙන්වා දුන්හ. පුද්ගලයා සිදු කරන සෑම යහපත් ක්‍රියාවකට ම දානය මූලික වන බව උන්වහන්සේ දේශනා කළහ. ග්‍රාහකයා වැඩි වශයෙන් දානාදී පින්කම් වෙත යොමු වීමෙන් තෘෂ්ණාවෙන් තොර සත්ත්වයෙකු නිර්මාණය වේ. දානය පිණිස පුරුදු පුහුණු වූ සිත ඕනෑ ම දෙයක් ඕනෑ ම මොහොතක නොමසුරු ව අත්හැරීමට පෙලඹේ. තථාගතයන් වහන්සේ දානාදී සත් ක්‍රියාවන්හි අර්ථය පහදා දීමෙන් අනතුරුව සිල් ද

කිමේ වටිනාකම පිළිබඳ දේශනා කළහ. දානය මෙන් ම ශීලය ද සත්ත්වයාගේ ලෞකික ලෝකෝත්තර අභිමතාර්ථ සාධනය පිණිස ඉවහල් වේ. මීළඟට කාමයන්ගේ ආදීනව කෙරෙහි ශ්‍රාවක අවධානය යොමු කරවා කාමයන්ගේ ළාමක බව වෙසෙසා පහදා දෙති. කාමය නිසා සත්ත්වයා කෙලෙසෙන අයුරු පහදා දෙන තථාගතයන් වහන්සේ ඉක්බිති ව කාම භවයන්ගෙන් මිදීමේ වටිනාකම අනාවරණ කරති. මෙය නෙක්ඛම්ම නම් වේ (මහාග්ගපාළිය 1, 2006).

බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ ධර්ම සන්නිවේදන පිළිවෙත සෑම අතින් ම සුවිශේෂ වූවකි. ග්‍රාහකයාගේ කායික, මානසික විභේදනයට අනුව ඔහු ඉතා පහළ මට්ටමක සිට ඉහළ මට්ටමකට ඔසවා තැබීම ධර්ම සන්නිවේදනයේ අරමුණයි. ග්‍රාහකයා සරල මානසික මට්ටමේ සිට ගැඹුරු ජීවන යථාර්ථයන් අවබෝධ කර ගැනීම දක්වා මෙහෙයවීමට බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන වදාළ සන්නිවේදන ශිල්පක්‍රම මගින් අවකාශ සැලසේ. සංදේශයෙහි අන්තර්ගත කරුණු මෙන් ම සංදේශය ඉදිරිපත් කරන ශිල්පක්‍රමය ද ඒ අතරින් ප්‍රධාන වේ. විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන තමන් වහන්සේ අභිමුවට පැමිණෙන ග්‍රාහක සමූහයා පියවරෙන් පියවර සරල මානසික මට්ටමේ සිට ගැඹුරු ජීවන පරිඥානය ළඟා කර ගැනීමේ මාවතට ප්‍රවිෂ්ට කරවීම උදෙසා බුදුරජාණන් වහන්සේ විසින් විවිධ සන්නිවේදන ශිල්පක්‍රම භාවිතයට ගැනිණ.

**නිගමනය**

බුදුදහම සංදේශ සකස් කිරීමේ දී සංදේශයේ පවතින සත්‍යවාදී බව මෙන් ම ඵලදායී බව කෙරෙහි අවධානය යොමු කරයි. එහි දී සංදේශ අන්තර්ගතය සම්බන්ධයෙන් වන බෞද්ධ පිළිවෙත වන්නේ කුසල් දහම් වැඩෙන අකුසල් දහම් පිරිහෙන ඕනෑ ම අදහසක් ප්‍රකාශනයට ඉඩ ඇත යන්න යි. තවදුරටත් තොරතුරු සමාජගත කිරීමේ දී ග්‍රාහකයාගේ සංජානන හැකියාව හා සන්නිවේදනයේ මූලික අවශ්‍යතාව හා ඵලදායී බව පිළිබඳ අවධානය යොමු විය බව බුදුදහම පෙන්වා දෙයි. ඒ සඳහා සංදේශයේ අන්තර්ගතය ග්‍රාහකස්ථානය වෙත මැනවින් සන්නිවේදනය කිරීමට සන්නිවේදන ශිල්පක්‍රම වැදගත් වේ. ඕනෑ ම සංදේශයක් ග්‍රාහකයාගේ රුචිකත්වයට සහ අවශ්‍යතාවට අනුරූප ලෙස පැහැදිලි කිරීම, විමර්ශනය කිරීම, විශ්ලේෂණය කිරීම සාර සන්නිවේදනයේ දී අත්‍යවශ්‍ය කරුණක් බව බුදුදහම පෙන්වා දෙයි.

එහි දී බුදුදහම තොරතුරු සන්නිවේදනයේ දී සන්නිවේදකයාගේ අරමුණුවල ඵලදායකත්වය, සංදේශයේ ඵලදායකබව සහ ග්‍රාහකයා ලබන තොරතුරුවල ඵලදායක බව අවධාරණය කරයි. සංදේශයේ අන්තර්ගතය මගින් ග්‍රාහකයාට සිදු කෙරෙන ඵලදායි සන්නිවේදන කාර්යය පිළිබඳ අවධානය යොමු කර ඇත. සංදේශයක් ග්‍රාහකගත කිරීමේ බෞද්ධ දාර්ශනික පර්යාලෝකය අනුව සන්නිවේදන ශිල්පක්‍රම භාවිතය මඟින් තොරතුරු සන්නිවේදනය මගින් සිදුවන ග්‍රාහක අනවබෝධයන් දුරුකිරීම, තොරතුරු අර්ථකථනයේ දුර්වලතා වැළැක්වීම, සංදේශය විකෘතිවීම වළක්වා ගැනීම මෙන් ම ග්‍රාහකයාගේ වහා අවබෝධයට දායක වීම, සමාජ අන්තර් සම්බන්ධතා ශක්තිමත් කිරීම හා විචාරාත්මක චින්තනයට මග විවර කරයි.

ග්‍රාහකයා සරල මානසික ස්වභාවයේ සිට ගැඹුරු ජීවන යථාර්ථයන් අවබෝධ කර ගැනීම දක්වා මෙහෙය වීමට බුදුදහමේ පෙන්වාදෙන සන්නිවේදන ශිල්පක්‍රම මගින්

අවකාශ සැලසේ. ඒ අතරින් සංදේශයෙහි අන්තර්ගත කරුණු මෙන් ම සංදේශය ඉදිරිපත් කරන ශිල්පක්‍රමය ද ප්‍රධාන වේ. ගතිකා සහිත ග්‍රාහක සමූහයා පියවරෙන් පියවර සරල මානසික මට්ටමේ සිට ගැඹුරු ජීවන පරිඥානය ළඟා කර ගැනීමේ මාවතට ප්‍රවිෂ්ට කරවීම උදෙසා සමාජ, මනෝවිද්‍යාත්මක පදනමක් සහිතව සන්නිවේදන ශිල්පක්‍රම භාවිතයට ගැනීමේ වැදගත්කම පෙන්වා දෙයි.

**ප්‍රමුඛ පද** - ග්‍රාහකයා, සංදේශය, සන්නිවේදන ශිල්පක්‍රම, ඵලදායීබව, බුදුදහම

### ආශ්‍රිත ග්‍රන්ථ

*මජ්ඣිමනිකාය II*, (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මහාවග්ගපාළිය I*, (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

Bawden, D. and Robinson, L. (2009). ‘The dark side of information: Overload, anxiety and other paradoxes and pathologies’, *Journal of Information Science*, 35(2), pp. 180 - 191.

https://doi.org/10.1177/0165551508095781

Carr, N. (2010). *The Shallows: What the Internet Is Doing to Our Brains*. New York: W.W. Norton & Company.

Eppler, M.J. and Mengis, J. (2004). ‘The concept of information overload: A review of literature from organization science, accounting, marketing, MIS, and related disciplines’, *The Information Society*, 20(5), pp. 325 - 344.

https://doi.org/10.1080/01972240490507974

Simon, H.A. (1971). ‘Designing organizations for an information-rich world’, in Greenberger, M. (ed.) *Computers, Communications, and the Public Interest*. Baltimore, MD: Johns Hopkins University Press, pp. 37 - 72.